(iii) විදේශ සේවාදායකයන්ට ඉදිරි මුහුණතේ සේවා (front end services) සැපයීම;

(iv) මූල්‍ය සැපයුම් දාමය කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම් මෙහෙයවීම මගින් ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

(v) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ බහුවිධ රටවල් ඒකාබද්ධ කිරීම වැනි සැපයුම් සේවා සිදු කිරීම.

න) ඕනෑම තැනැත්තෙකු යම් නිර්වාසික සමාගමක හරවත් සහභාගිත්වය සම්බන්ධයෙන් එම නිර්වාසික සමාගමමෙන් ලැබුණු ලාභාංශ සහ කොටස් උපලබ්ධිවීමෙන් ලබන ලැබීම් (දේශීය අදායම් පනතේ තුන්වන උපලේඛනයේ (ඩ) ඡේදයේ හරවත් සහභාගිත්වය ලෙස අර්ථ දක්වා ඇති පරිදි)

ප) යම් තැනැත්තෙකු කෘෂි ගොවිතැන සඳහා වූ ව්‍යවසායක නිෂ්පාදන, නිපැයුම් හෝ නිෂ්පාදන ක්‍රියාවලියකට භාජනය නොකර විකිණීමෙන් ලබන ලැබීම්

බ) නියම කරනු ලැබිය හැකි තොරතුරු තාක්ෂණ සහ සඵල සේවා සැපයීම

ම) ගෙවීම විදේශ ව්‍යවහාර මුදලින් ලැබෙන්නේ නම් සහ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන්නේ නම්, ශ්‍රී ලංකාවෙන් පිටත දී භාවිතා කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තෙකුට ශ්‍රී ලංකාව තුළදී හෝ ඉන් පිටතදී සලසනු ලබන සේවා මත ලබන ලැබීම්;

ය) ඕනෑම විදේශ ප්‍රභවයකින් ලබන ලාභ සහ ලැබීම් [(ආ) වන උපඅයිතමයේ සඳහන් ලැබීම් සහ ලාභ හැර], එවැනි ලැබීම් සහ ලාභ විදේශ ව්‍යවහාර මුදලින් ඉපයීම සිදු කර බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන්නේ නම්,

යය) යම් නිර්වාසික තැනැත්තෙකු රසායනාගාර සේවා හෝ තත්ව සහතික ලබාදීමේ සේවා සැපයීමෙන් ලබන ලැබීම්

(2) 2018 අප්‍රේල් මස 01 දිනැති අංක 2064/53 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති පරිදි, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 16ඇ, 16ඈ, 16ඉ, 24අ වගන්තිවල ප්‍රතිපාදන යටතේ පුද්ගලයෙකුගේ ලාභ සහ ආදායම සම්පූර්ණයෙන්ම හෝ කොටසක් එම ප්‍රතිපාදනවල නිශ්චිතව දක්වා ඇති කාල සීමාවක් සඳහා නිදහස් කර ඇත්නම් සහ 2018 මාර්තු 31 වන විට ඒ කාල සීමාවෙන් කොටසක් නොගෙවී ඉතිරිව ඇති අවස්ථාවක එම කොටස ඒ විධිවිධාන අඛණ්ඩව පවතින්නාක් මෙන් උපකල්පනය කර ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබුවා සේ අඛණ්ඩව පැවතිය යුතුය.

(3) 2018.09.17 දිනැති අංක 2089/1 දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් පරිදි

අ. යම් ව්‍යවසායක් 2018 අප්‍රේල් 01 දිනට පෙර 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ ඇත්නම්; සහ

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

ආ. එම ගිවිසුම තුළින්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත හෝ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ එම ව්‍යවසායේ ලාභ සහ ආදායම හෝ එම ව්‍යවසාය මඟින් ගෙවනු ලබන යම් ලාභාංශ, සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් ආදායම් බද්දෙන් නිදහස් කිරීමට හෝ අඩු කළ අනුප්‍රමාණ වලට බදු කිරීමට, හෝ ආදායම් බදු බැඳියාව ආගණනය කිරීමේ පදනමට අදාළව ප්‍රතිපාදන සලසයි නම්,

එම ව්‍යවසායේ ලාභ සහ ආදායම් හෝ එම ව්‍යවසාය මඟින් ගෙවනු ලබන යම් ලාභාංශ තවදුරටත් එම ගිවිසුම යටතේ දක්වා ඇති ආකාරයට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්දෙන් නිදහස් කිරීම හෝ එම ගිවිසුමේ පරිදි ගණනය කරන ලද සහ එහි සඳහන් අනුප්‍රමාණයට බද්දට යටත් කිරීම සිදුකළ යුතුය.

**ඇමුණුම 3 - සුදුසුකම් ලබන ගෙවීම්**

අ) අනුමත පුණ්‍ය ආයතනයකට මුදලින් සිදු කළ පරිත්‍යාග - පුද්ගලයකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් හතරෙන් එකක ප්‍රමාණයක් (බදු අය කළ හැකි ආදායමෙන් තුනෙන් එකක්) හෝ රු. 75,000 හෝ පරිත්‍යාග කළ ප්‍රමාණය යන ඒවායින් කවර හෝ අඩු අගය.

ආ) රජයට හෝ දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ සඳහන් නිශ්චිත ආයතනයකට මුදලින් හෝ වෙනත් ආකාරයකින් සිදු කරන ලද මුළු පරිත්‍යාග.

ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ කරන ලද පසුගිය තක්සේරු වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද සුදුසුකම් ලබන ගෙවීම්වල අඩු නොකළ ශේෂයක්

**ඇමුණුම 4 - අවසාන රඳවා ගැනීමේ ගෙවීම්, අවසාන නොවන රඳවා ගැනීමේ ගෙවීම් සහ අදාළ වන බදු අනුප්‍රමාණ**

| | ගෙවීම් වර්ගය | රඳවා ගැනීමේ බදු අනුප්‍රමාණ |
|---|---|---|
| (අ) | ඔට්ටු ඇල්ලීම හෝ සූදුවලින් සමන්විත ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී ලද මුදල් ප්‍රමාණ හැර ලොතරැයි, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම් හෝ සූදුවලින් දිනුම් ලෙස ගෙවන ලද මුදල් ප්‍රමාණ | 14% අවසානාත්මක |
| (ආ) | පොලී හැර රඳවා ගැනීමේ බද්දට යටත් නිර්වාසික තැනැත්තෙකු වෙත සිදු කරන ගෙවීම් (ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් හරහා උපයන ලද ගෙවීම් හැර) | 14% අවසානාත්මක |



www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

| | | |
|---|---|---|
| (ඇ) | නිර්වාසික තැනැත්තෙකුට ගෙවන ලද හෝ උපයනු ලැබූ ලෙස සලකනු ලබන පොලියක් හෝ වට්ටමක් | 5% අවසානාත්මක |
| (ඇ) | වෙන්දේසියේ විකුණන ලද යම් මැණිකක විකුණුම් මිල | 2.5% |

**ඇමුණුම 5 - සහනදායී අනුප්‍රමාණ යටතේ බද්දට යටත් වන සේවාන්ත ප්‍රතිලාභ**

i. විශ්‍රාම වැටුපක් පරිවර්තිත කිරීමේ දී ලැබූ මුදල් ප්‍රමාණ.

ii. විශ්‍රාම පාරිතෝෂිකයක් වශයෙන් ලැබූ මුදල් ප්‍රමාණ.

iii. සේවායෝජකයෙකු විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ සියලු පුද්ගලයන්ට එක සමානව අදාළ වන බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන ක්‍රමයක් යටතේ ධූරය හෝ සේවා නියුක්තිය අහිමිවීම සම්බන්ධයෙන්, වන්දි මුදලක් ලෙස ලැබූ මුදල් ප්‍රමාණ.

iv. සේවා නියුක්තියෙන් විශ්‍රාම ලැබූ වේලාවේ දී හෝ ඉන්පසු, කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද එම තැනැත්තා විසින් එම අරමුදලට ගෙවන ලද දායක මුදල් නියෝජනය නොකරන්නා වූ ද යම් මුදල් ප්‍රමාණ.

v. යම් සේවා යෝජකයෙකු විසින් 1968 අප්‍රේල් මස 01 වන දිනයට පෙර, තත් අර්ථසාධක අරමුදලට ගෙවන ලද දායක මුදල් නියෝජනය නොකරන්නා වූ නියාමනය කරන ලද අර්ථසාධක අරමුදලකින් යම් තැනැත්තකුට ගෙවන ලද මුදල් ප්‍රමාණය සහ සේවා යෝජකයා විසින් ගෙවන ලද එම දායක මුදල සහ ඒ මත උපචිත මූ පොලිය ද මත 15% ක අනුප්‍රමාණයකින් සේවා යෝජකයා විසින් බදු ගෙවා ඇත්නම් එවිට, සේවා යෝජකයා විසින් ගෙවන ලද දායක මුදල් මත උපචිත වූ පොලිය; සහ

vi. යම් තැනැත්තෙකු සේවා නියුක්තියෙන් විශ්‍රාම ලැබූ අවස්ථාවේ දී හෝ ඊට පසු 1980 අංක 16 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතින් ස්ථාපිත සේවා නියුක්තයන්ගේ භාර අරමුදලින් එම තැනැත්තාට ගෙවනු ලැබූ මුදල් ප්‍රමාණ

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත නොකරන ලද, සේවය අහිමි වීම වෙනුවෙන් ලැබුණු වන්දියක්, අර්ථසාධක අරමුදලින් ලැබුණු ගෙවීමක් (නියාමනය නොකරන ලද නොවන හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් අනුමත නොකරන ලද අර්ථසාධක අරමුදල්), වෙනත් ගෙවීම් හෝ සේවාන්තයේ දී ලැබෙන මූල්‍ය නොවන ප්‍රතිලාභ සාමාන්‍ය වැඩිවන අනුප්‍රමාණ යටතේ බද්දට යටත් වේ.



www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

ඇමුණුම 6 - සේවාන්ත ප්‍රතිලාභ මත අදාළ වන සහනදායී බදු අනුප්‍රමාණ

| **සේවානියුක්තියෙන් ලද මුළු සේවාන්ත ප්‍රතිලාභ** | **බදු අනුප්‍රමාණය** |
|---|---|
| පළමු රු. 10,000,000 | 0% |
| දෙවන රු. 10,000,000 | 6% |
| ශේෂය මත | 12% |

**ඇමුණුම 7 - සාමාන්‍ය වැඩිවන බදු අනුප්‍රමාණ**

| **බදු අයකළ හැකි ආදායම** | **බදු අනුප්‍රමාණය** |
|---|---|
| පළමු රු. 3,000,000 | 6% |
| ඊළඟ රු. 3,000,000 | 12% |
| ශේෂය මත | 18% |

**අනෙකුත් විශේෂ බදු අනුප්‍රමාණ**

ඔට්ටු සහ සූදු, මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයක්, නිෂ්පාදනය කිරීම සහ විකිණීම හෝ ආනයනය සහ විකිණීම සිදු කරන ව්‍යාපාරයක් (සිල්ලර වෙළඳාම හැර) - 40%



www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

**වැඩිදුර තොරතුරු සඳහා**

වැඩිදුර තොරතුරු සඳහා ලේකම් අංශයේ හෝ අදාළ ප්‍රාදේශිය කාර්යාලයේ නිලධාරීන් අමතන්න.

| | | |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | ලේකම් අංශය | 0112135413<br>0112135438<br>0112135434<br>0112135441<br>0112135433 |
| නගරබද කාර්යාලය | කොළඹ නගර | 0112504390 |
| නගරබද කාර්යාලය | මැද කොළඹ | 0112505274 |
| නගරබද කාර්යාලය | කොළඹ දකුණ | 0112502564 |
| නවම් මාවත | 1 සහ 2 අංශය | 0112302249 |
| ප්‍රාදේශිය කාර්යාලය | අනුරාධපුරය | 0252235512 |
| ප්‍රාදේශිය කාර්යාලය | බදුල්ල | 0552222490 |
| ප්‍රාදේශිය කාර්යාලය | මඩකලපුව | 0652222087 |
| ප්‍රාදේශිය කාර්යාලය | දඹුල්ල | 0662283655 |
| ප්‍රාදේශිය කාර්යාලය | ගාල්ල | 0912222504 |
| ප්‍රාදේශිය කාර්යාලය | ගම්පහ | 0332234246 |
| ප්‍රාදේශිය කාර්යාලය | යාපනය | 0212222076 |
| ප්‍රාදේශිය කාර්යාලය | කළුතර | 0342222216 |
| ප්‍රාදේශිය කාර්යාලය | මහනුවර | 0812223590 |
| ප්‍රාදේශිය කාර්යාලය | කෑගල්ල | 0352222493 |
| ප්‍රාදේශිය කාර්යාලය | කුරුණෑගල | 0372222798 |
| ප්‍රාදේශිය කාර්යාලය | මහරගම නැගෙනහිර | 0112803127 |
| ප්‍රාදේශිය කාර්යාලය | මහරගම බටහිර | 0112803125 |
| ප්‍රාදේශිය කාර්යාලය | මාතර | 0412222933 |
| ප්‍රාදේශිය කාර්යාලය | මීගමුව | 0312228322 |
| ප්‍රාදේශිය කාර්යාලය | නුවරඑළිය | 0522222520 |
| ප්‍රාදේශිය කාර්යාලය | රත්නපුර | 0452222040 |

*බදු - වඩා හොඳ අනාගතයකට*



www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

# උදාහරණ

## උදාහරණය 1

රුවන් මහතා ABC සමාගමේ ප්‍රධාන මූල්‍ය නිලධාරී වේ. 2020/2021 තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ ආදායම පහත පරිදි වේ;

- සේවානියුක්ති ආදායම රු. 5,500,000 (ඔහු අත්තිකාරම් පුද්ගල අදායම් බද්ද අඩු කිරීම සඳහා කැමැත්ත පළ කර නොමැත).
- පොලී ආදායම රු. 2,200,000 (ඔහු අත්තිකාරම් අදායම් බද්ද අඩු කිරීම සඳහා කැමැත්ත පළ කර නොමැත).
- ව්‍යාපාර ආදායම (ඉඩදිය හැකි වියදම් අඩු කිරීමෙන් පසු) රු. 1,000,000.

සේවානියුක්ති ආදායම තුළ මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ ඇතුළත් වේ. ඔහු විසින් සෞඛ්‍ය වියදම් ලෙස රු. 275,000 ක්, කොටස් මිලදී ගැනීම සඳහා රු. 600,000ක් සහ ඔහුගේ දරුවන්ගේ පාසල් ගාස්තු ලෙස රු. 500,000 දරා ඇත. එසේම, ඔහු අපේක්ෂා රෝහල වෙත රු. 100,000 ක් පරිත්‍යාග කර ඇත. එක් එක් කාර්තුව සඳහා රු. 80,000 බැගින් ආදායම් බදු ගෙවා ඇත.

**ආදායම් බදු බැදියාව ගණනය කිරීම**

| | | |
|---|---|---|
| | | රු. |
| සේවානියුක්ති ආදායම | | 5,500,000 |
| පොලී ආදායම | | 2,200,000 |
| ව්‍යාපාර ආදායම | | 1,000,000 |
| **තක්සේරු කළ හැකි ආදායම** | | **8,700,000** |
| අඩු කිරීම් - සහන | | |
| • වියදම් සහනය | (275,000+600,000+500,000 = 1,375,000) (1,200,000 ට සීමා වේ.) | (1,200,000) |
| • පුද්ගලික සහනය | | (3,000,000) |
| අඩු කිරීම් – සුදුසුකම් ලබන ගෙවීම් | | |
| • අපේක්ෂා රෝහගට කරන ලද පරිත්‍යාග | | (100,000) |
| **බදු අය කළ හැකි ආදායම** | | **4,400,000** |
| **බදු බැදියාව** | 3,000,000 x 6% = 180,000 | |
| | 1,400,000 x 12% = 168,000 | **348,000** |
| **ගෙවිය යුතු මුළු බද්ද (2020/2021)** | | **348,000** |
| **වාරික ගෙවීම්** | | |
| 1 වන වාරිකය | 80,000 | |
| 2 වන වාරිකය | 80,000 | |
| 3 වන වාරිකය | 80,000 | |
| 4 වන වාරිකය | 80,000 | |
| ගෙවූ මුළු බද්ද | 320,000 | **320,000** |
| **ගෙවිය යුතු ඉතිරි බද්ද** | | **28,000** |



www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

**උදාහරණය 2**

මාහාචාර්ය හරීන් ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ සේවය කරයි. ඒ සමහම ඔහු උපාධි අධ්‍යාන පීඨය සඳහා තම සේවය සපයනු ලබයි. 2020/2021 තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ ආදායම පහත පරිදි වේ;

- කොළඹ විශ්වවිද්‍යාලයෙන් ලබන ආදායම (ප්‍රාථමික සේවානියුක්තිය) (ප්‍රාථමික සේවානියුක්තිය) - රු. 4,680,000 (අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම සඳහා කැමැත්ත පළ කර ඇත).
- උපාධි අධ්‍යාන පීඨයෙන් ලබන සේවානියුක්ති ආදායම (ද්විතියික සේවා නියුක්තිය) - රු. 200,000 (අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම සඳහා කැමැත්ත පළ කර ඇත. ප්‍රාථමික සෙවානියුක්තියෙන් ලබන මාසික ආදායම රු. 25.,001 – 500,000 පරාසය තුළ වන බැවින් අදාළ වන බදු අනුප්‍රමාණය 12% වේ)
- පොලී ආදායම රුග 700.000 (අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම සඳහා කැමැත්ත පළ කර නොමැත)
- කුලී ආදායම රු. 900,000 (අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම සඳහා කැමැත්ත පළ කර නොමැත)

සේවානියුක්ති ආදායම තුළ මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ ඇතුළත් වේ. ඔහු විසින් සෞඛ්‍ය වියදම් සහ වෛද්‍ය රක්ෂණය සඳහා රු. 100,000 ක්, නිවාස ණය පොලී ලෙස රු. 150,000 ක්, ඔහුගේ දරුවාගේ අතිරේක පන්ති ගාස්තු (tuition fees) ලෙස රු. 145,000 ක් සහ කොටස් මිලදී ගැනීම සඳහා රු. 400,000 ක් දරා ඇත.

**ආදායම් බදු බැඳියාව ගණනය කිරීම**

| | | රු. |
|---|---|---|
| සේවානියුක්ති ආදායම (ප්‍රාථමික + ද්විතියික) | | 4,880,000 |
| ආයෝජන ආදායම | | 1,600,000 |
| • පොලී ආදායම | 700,000 | |
| • කුලී ආදායම | 900,000 | |
| **තක්සේරු කළ හැකි ආදායම** | | **6,480,000** |
| අඩු කිරීම් - සහන | | |
| • කුලී ආදායම සඳහා සහනය | 900,000*25% | (225,000) |
| • වියදම් සහනය | (100,000+150,000+145,000 +400,000) | (795,000) |
| • පුද්ගලික සහනය | | (3,000,000) |
| **බදු අය කළ හැකි ආදායම** | | **2,460,000** |
| මුළු බදු බැඳියාව | 2,460,000 x 6% = 147,600 | 147,600 |
| **අඩු කිරීම - බදු බැර** | | |
| **ගෙවූ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද** | **124,800** | **(124,800)** |
| **ගෙවිය යුතු ඉතිරි බද්ද** | | **22,800** |



www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

**උදාහරණය 3:**

පෙරේරා මහතා සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදනය කරන ව්‍යාපාරයක නිරත වේ. 2020/2021 තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ ආදායම පහත පරිදි වේ;

- ව්‍යාපාර ආදායම (ඉඩදිය හැකි වියදම් අඩු කිරීමෙන් පසු) රු. 15,000,000
- පොලී ආදායම රු. 1,000,000 (පොලී ආදායමෙන් 6% ක අනුප්‍රමාණයට අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම සඳහා කැමැත්ත පළ කර ඇත. ඒ අනුව, පොලී ආදායම මත මේ දක්වා අඩු කරන ලද අත්තිකාරම් ආදායම් බද්ද රු. 60,000 කි (රු. 1,000,000 x 6%).

  ඔහ් විසින් සෞඛ්‍ය වියදම් සහ රක්ෂණය සඳහා රු. 240,000 ක්, නිවාස ණය පොලී ලෙස රු. 100,00ක් දරා ඇත. 2020/2021 තක්සේරු වර්ෂයේදී ගෙවිය යුතු බද්දට හිලව් කිරීම සඳහා ඉදිරියට ගෙන එන ලද ආර්ථික සේවා ගාස්තු ප්‍රමාණය රු. 100,000 කි. එක් එක් කාර්තුව සඳහා රු. 350,000 බැගින් ආදායම් බදු ගෙවා ඇති අතර ගෙවිය යුතු ඉතිරි බද්ද 2021 සැප්තැම්බර් මස 30 වන දින ගෙවීමට නියමිතය.

**ආදායම් බදු බැදියාව ගණනය කිරීම**

| | | රු. |
|---|---|---|
| ව්‍යාපාර ආදායම | | 15,000,000 |
| ආයෝජන ආදායම | | |
| • පොලී ආදායම | | 1,000,000 |
| **තක්සේරු කළ හැකි ආදායම** | | **16,000,000** |
| අඩු කිරීම් - සහන | | |
| • වියදම් සහනය | | 340,000 |
| • පුද්ගලික සහනය | | 3,000,000 |
| **බදු අය කළ හැකි ආදායම** | | **12,660,000** |
| **ගෙවිය යුතු මුළු බද්ද** | 3,000,000 x 6% = 180,000 | |
| | 3,000,000 x 12% = 360,000 | |
| | 6,660,000 x 18% = 1,198,800 | **1,738,800** |
| අඩු කිරීම් - බදු බැර | | |
| ඉදිරියට ගෙන එන ලද ආ.සේ.ගා | 100,000 | |
| අත්තිකාරම් ආදායම් බද්ද | 60,000 | |
| වාරික ගෙවීම් | | |
| 1 වන වාරිකය | 350,000 | |
| 2 වන වාරිකය | 350,000 | |
| 3 වන වාරිකය | 350,000 | |
| 4 වන වාරිකය | 350,000 | |
| ගෙවූ මුළු බද්ද | | **1,560,000** |
| ගෙවාය යුතු ඉතිරි බද්ද | | **178,000** |



www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk